# Being in christ. Sam J - 23 June 19

## ක්‍රිස්තුස්වහන්සේ තුළ පැවතීම

ක්‍රිස්තුස්වහන්සේ තුළ පැවතීම යනුවෙන් අදහස් වෙන්නේ කුමක්ද? ක්‍රිස්තුස්වහන්සේ තුළ පැවතීමෙන් ලැබෙන ප්‍රතිලාභ මොනවාද? ක්‍රිස්තුස්වහන්සේ තුළ පැවතීම වැදගත්වෙන්නේ ඇයි?

ක්‍රිස්තුස්වහන්සේ තුළ පැවතීම යනුවෙන් අදහස් වෙන්නේ කුමක්ද? ඔබ යමක් තුළ සිටින විට එම දෙය ඔබව වටකරවයි. ඔබ නිවසක් තුළ සිටින විට එය ඔබට ආරක්ෂාව දෙයි. නිවසෙන් පිටත සිටීමට වඩා එය ඉතා වෙනස්ය. නිවස තුළ සිටිනවිට ඔබ සුරක්ෂිත බව සහ ඔබ ශක්තිමත් සහ ස්ථාවර බව ඔබට දැනෙයි.

2 කොරින්ති 5:17 එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය. පරණදේ පහව ගියේය; මෙන්න සියල්ලම අලුත්වී තිබේ.

මෙය මූලික සත්‍යයක් වුනත් ඔවුන් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටිනවා පරණ දේවල් පහව ගියා යැයි කියන විට එය තේරුම් ගැනීමට බොහෝ දෙනා අසමත් වෙති. වෙනත් වචන වලින් නම් පරණ ස්වභාවය, පරණ පුරුදු, පාපිෂ්ඨවූ පරණ ක්‍රියා කරන ක්‍රම ආදිය පහවී ගොස් අලුත් මැවිල්ලක් පැමිණ තිබේ.

ඔවුන් ක්‍රිස්තුස්වහන්සේ තුළ පවතින බව කියාගන්නා හෝ ක්‍රිස්තියානි යැයි කියාගන්නා කිසිම කෙනෙකුට පරණ පාපිෂ්ඨ ස්වභාවයෙන් ජීවත් විය නොහැක. මක්නිසාද එයින් කියන්නේ පරණ දේ පහව ගොස් අලුත් දේ පැමිණ තිබෙන බව එයින් කියැවෙන නිසාය.

ක්‍රිස්තුස්වහන්සේ තුළ = අලුත් මැවිල්ල = අලුත් ස්වභාවය = අලුත් පුරුදු = අලුත් හැසිරීම් = අලුත් ජීවන රටාව

ක්‍රිස්තුස්වහන්සේ තුළ පවතින කිසිම කෙනෙකුට ඊට පෙර කළාවූ පාපිෂ්ඨවූ හෝ සල්ලාලවූ දේවල් හෝ මමත්වයට අවධානය දෙන දේවල් තවත් කළ නොහැක. තවත් වචන වලින් නම් අප උදෙසා සහ උන්වහන්සේ සමග අපේ **අනන්‍යතාවය** උදෙසා ක්‍රිස්තුස්වහන්සේගේ මරණය සහ උත්ථානය සිදුවූ බැවින් ඇදහිල්ලෙන් අලුත් මැවිල්ලක් ලෙස ජීවත්වීමේ හැකියාව දෙයි. අප අලුත් මැවිල්ල ගැන කතා කරන විට එයින් මෝස්තර රටාව, සෑදීම, හැඩගැස්ම, නිරූපනය, එකට තැබීම, පිහිටුවීම, ගොඩනැංවීම, යනාදී සියල්ලම අදහස් වේ. ඔබ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබගේ ස්වාමින් සහ ගැලවුම්කරු ලෙස පිළිගන්නා විට හරියටම සිදුවන්නේ මෙයයි - ඔබ අලුත් මැවිල්ලක්, අලුත් මෝස්තර රටාවක්, අලුත් සෑදීමක්, අලුත් නිරූපනයක්, ලෙස දෙවියන්වහන්සේ විසින් ඔබ යම් ආකාරයකට සිටිය යුතුයැයි කියා කැඳවා ඇති ආකාරයේ කෙනෙක් ලෙස ඔබව සාදා පිහිටුවා ඇත. මෙය අපූරුයි නොවේද! දෙවියන්වහන්සේ මෙසේ කරන්නේ උන්වහන්සේට අපව අවශ්‍ය කරන නිසාත් උන්වහන්සේ කිසිම වාසියක් ගැන නොසිතා අපට ආදරය කරන නිසාත්ය.

ක්‍රිස්තුස්වහන්සේ තුළ අලුත් මැවිල්ලක්ව පැවතීමේ සැබෑ අනන්‍යතාවය ඔබ විසින් අල්ලා ගැනීම මට ඇත්තටම අද ඕනෑ කරනවා. මේ අලුත් මැවිල්ල තුළ පරණ මමත්වයේ කිසිම දේකට පැවතිය නොහැකියි. තවමත් අපි පරණ ස්වභාවයේ දේවල්වල නිරතවෙනවාද කියා අපේ අලුත් මැවිල්ලෙන් මම ප්‍රශ්න කරනවා.

1 එසේනම් ක්‍රිස්තුස්වහන්සේ තුළ පැවතීම යනුවෙන් අදහස් වෙන්නේ කුමක්ද ගලාති 3:26-27 බලන්න : පළමුව නුඹලා ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇදහීමෙන් දෙවියන්වහන්සේගේ දරුවන්ව සිටිති (එපීස 2:12-13). දෙවනුව නුඹලා ක්‍රිස්තුස්වහන්සේ තුළට බව්තීස්ම කරනු ලැබ (උන්වහන්සේගේ මරණය සහ උත්ථානය සමග අනන්‍යතාවයක් ඇතිකරගෙන) ක්‍රිස්තුස්වහන්සේ පැළඳගෙන සිටින්නහුය. තුන්වෙනුව නුඹලා සියල්ලන් ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්කෙනෙක්ව සිටින නිසා, යුදෙව්වෙක් හෝ ග්‍රීකයෙක් නැත්තේය, දාසයෙක් හෝ නිර්දාසයෙක් නැත්තේය, පුරුෂයෙක් සහ ස්ත්‍රියක් නැත්තේය. මෙය අපූරු

දෙයක් නොවේද! ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින අයට කුලයක් හෝ ඇදහිලික්‍රමයක් හෝ ඉහළ සමාජයක් හෝ පහළ සමාජයක් නැත. ජාතිභේද හෝ සංස්කෘතික වෙනස්කම් නැත. නමුත් උන්වහන්සේ තුළ සියලු දෙනාම එක සමානය. කොලොස්සි 3:3 මක්නිසාද නුඹලාගේ පරණ මමත්වය මැරී ඇත, නුඹලාගේ අලුත් ජීවනය ක්‍රිස්තුස්වහන්සේ සමග දෙවියන්වහන්සේ තුළ සඟවා තිබේ.

ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටීම යනුවෙන් අදහස් කෙරෙන්නේ අපේ පාප උදෙසා ගෙවීම ලෙස උන්වහන්සේගේ පූජාව අප පිළිගත් බවයි. මෙහි අදහස කුමක්ද? උන්වහන්සේ අප වෙනුවෙන් කළ පූජාව අප විසින් පිළිගන්නා විට උන්වහන්සේ අප සමග තිබෙන ගනුදෙනු මාරු කරනසේක. අපගේ පාප ලැයිස්තුව දෙවියන්වහන්සේව සම්පූර්ණයෙන්ම සතුටු කරවන උන්වහන්සේගේ ගිණුමට හුවමාරු කරනසේක (2 කොරින්ති 5:21 කිසි පාපයක් නොදත් උන්වහන්සේ පාපය වෙන්ට සැලැස්වූසේක). ඔබ ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින විට ඔබ ශුද්ධවූ දෙවියන්වහන්සේගේ අභිමුඛයට ඇතුල්වන්නේය. අප ක්‍රිස්තුස්වහන්සේගේ ධර්මිෂ්ඨකම තුළ සඟවනු ලැබිය යුතුය. "ක්‍රිස්තුස්වහන්සේ තුළ" පැවතීම යනුවෙන් අදහස් වෙන්නේ තව දුරටත් අපේ අසම්පූර්ණත්වය දෙවියන්වහන්සේ නොදකින බවයි, උන්වහන්සේගේම පුත්‍රයාගේ ධර්මිෂ්ඨකම උන්වහන්සේ දකිනසේක එපිස 2:13

**2** ක්‍රිස්තුස්වහන්සේ තුළ පැවතීමෙන් ලැබෙන ප්‍රතිලාභ මොනවාද?

බොහෝ දේවල් තිබුණත් මම කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරන්නට කැමතියි: යේසුස්වහන්සේ ජීවිතකාලයටම මිත්‍රයෙක් වෙයි. උන්වහන්සේ සමග අපට දවසේ ඕනෑම වෙලාවක ඕනෑම දෙයක් ගැන කතා කළ හැකි ආකාරයේ කෙනෙකි. අමාරු මෙන්ම පහසු සෑම අවස්ථාවකදීම අප සමග සිටින අතර උන්වහන්සේට නිතරම අපට උපකාර කරන්නට පුලුවනි. "මට උදව් කරන්න, මම කරදරයෙන් ඉන්නේ, මම පව් කරමින් ඉන්නේ, මොනවා කරන්නද කියා මම දන්නේ නැහැ." කියා අපට යේසුස්වහන්සේ සමග කියන්නට හැකියි. එවිට යේසුස්වහන්සේ අපට මෙසේ කියනවා ඇති: "මම දන්නවා, මාත් ඒ පරීක්ෂාවට පත්වුනා, නමුත් මම එයින් ජය ගත්තා, ඒ කොහොමද කියා මම පෙන්වන්නම්. ඔබට ශක්තිය දෙන්නට මට ඉඩ දෙන්න." ඔබේ ජීවිතයට උදව්කාරයෙක් සහ සහායකයෙක් ලෙස ශුද්ධාත්මයාණන්වහන්සේව ලබා ගන්න, උන්වහන්සේ ඔබට සෑම සත්‍යයක් කරා මග පෙන්වනවා ඇත (යොහන් 16:13), අපේ දුර්වලකම්වලදී ආත්මයාණන්වහන්සේ අපට මග පෙන්වනසේක. අප යාච්ඤා කළ යුතු ආකාරය නොදන්නා විට උන්වහන්සේ අප උදෙසා යාච්ඤා කරනු ඇත, අප වෙනුවෙන් මැදහත්කාරකම් කරනවා ඇත (රෝම 8:26). ඔබව දුක්ඛිත කාලකණ්ණියෙක් කරන පාපය සහ සියලුම දේවල්වලින් ඔබ ජයගන්නවා ඇත. මේ ලෝකයේ තිබෙන සියලුම අභාග්‍ය/නරුම දේවල්වලින් අපට නිදහස් විය හැකියි. පාපයේ ජීවත්වීම ඔබව නිතරම තව තවත් ඕනෑකරන, සෑහීමට පත් නොවන හිස් කාලකණ්ණියෙක් කරනවා පමණයි. නමුත් ඔබ පාපය කෙරෙහි ජයගත් විට ප්‍රීතිය ලැබෙයි, සියලුම හිස්කම දුරුවෙයි, ඔබට සමාදානය සහ විවේකය ලැබෙයි (රෝම 8:28 සියල්ලම යහපත පිණිස වෙයි). අපට ස්වර්ගයේ සදාකාල ජීවනයක් ලැබෙයි, යේසුස්වහන්සේගේ මනමාලිය ලෙස සදහටම සමාදානයෙන් සහ ප්‍රීතියෙන් ජීවත්වීම! *"මළවුන්ගෙන් නැවත නැගිටීමද ජීවනයද මම වෙමි, මා කෙරෙහි අදහන්නා, මැරුණත් ජීවත්වන්නේය, ජීවත්වන කවුරු නමුත් මා කෙරෙහි අදහන්නේද ඔවුන් නොමැරෙන්නේය." (යොහන් 11:25-26)*

**3** ක්‍රිස්තුස්වහන්සේ තුළ පැවතීම වැදගත්වෙන්නේ ඇයි? නුඹලා බොහෝ පල දරනවා ඇත මක්නිසාද උන්වහන්සේ නැතුව නුඹලාට කිසි දෙයක් කරන්නට බැරිය (යොහන් 15:5) නුඹලාට තෘප්තිය, සමාදානය ලැබෙන්නේය, ඔබට කැමති දෙයක් ඉල්ලන්ට හැකිවෙයි, ඔබගේ ප්‍රීතිය සම්පූර්ණ වෙයි, ඔබගේ ජීවිතය යහපත් සම්පත්වලින් සහ යේසුස්වහන්සේගෙ කරුණාවෙන්ද අලංකාරයෙන්ද පිරී උතුරා යනු ඇත. සාතන්ට සහ යක්කුන්ට ඔබ කෙරෙහි බලය පවත්වන්ට නොහැකිවෙනු ඇති අතර ඔබ සාතන්ට එරෙහිව ජයග්‍රහණය කරනු ඇත. ඒ සියල්ලටම වඩා අනෙක් සියලුම නාමවලට වඩා උසස්වූ යේසුස්වහන්සේගේ නාමය ඔබට තිබේ. උන්වහන්සේ තුළ අපට නව ජීවනය ... අධික ජීවනය... සදාකාල ජීවනය තිබේ.